
# අඳුරට ආලෝකයක්
# இருளுக்கு ஒளி



ප්‍රකාශන අංක 01

# සමෘද්ධි

# සමෘද්ධි වැඩසටහන

යෞවන කටයුතු, ක්‍රීඩා සහ ග්‍රාම සංවර්ධන
අමාත්‍යංශයේ ප්‍රකාශනයකි.

යෞවන කටයුතු, ක්‍රීඩා සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යංශය,
4 වන මහල, දේශීය ආදායම් ගොඩනැගිල්ල,
චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

1994 දෙසැම්බර්

# සමෘද්ධි වැඩ සටහන

1993 වන විට ශ්‍රී ලංකාවේ ජනගහනය දශලක්ෂ 17.6 ක් වූ අතර, වාර්ෂික ජනගහන වර්ධන වේගය 1.2% ක් විය. ජනගහනයෙන් 72.3% ක් ග්‍රාමීය අංශයෙහිද, 21.4% ක් නාගරික අංශයෙහි ද, 6.3% ක් වතුකරයෙහි ද විය. ජනගහනයෙන් 65% - 70% අතර ප්‍රමාණයක් දිළිඳු බවින් පෙළෙන අතර, ඉන් 25% - 30% අතර ප්‍රමාණයක් වඩාත් දිළිඳු අය වූහ. දිළිඳු අයගෙන් 80% ක් ම ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වීම, ශ්‍රී ලංකා ආර්ථිකයේ කැපී පෙනෙන ලක්ෂණයකි. ඒ නිසා රජයේ දැඩි අවධානය ග්‍රාමීය සංවර්ධනයට යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වෙයි.

## දිළිඳුබව

අපේ රටේ ජීවත්වන දිළිඳු අයගේ සංඛ්‍යාව වාර්ෂිකව වර්ධනය වී ඇත. ආදායම් බෙදීයාමේ විෂමතාවය පුළුල්වීම, ග්‍රාමීය අංශයේ ජනගහනය ඉහළ යාම, ආර්ථික වර්ධන වේගය පහත වැටීම, ජීවන වියදම සීඝ්‍රයෙන් ඉහළයාම වැනි සාධක ගණනාවක් මේ තත්වයට බලපා ඇත. විශේෂයෙන්ම ආදායම් බෙදීයාමේ විෂමතාව දෙස බලනවිට මෙහි බැරෑරුම්කම් තේරුම් ගැනීම පහසුවේ.

| පහළම ආදායම් ලැබූ 20% | ඉහළම ආදායම් ලැබූ 20% |
|---|---|
| 1978 මුළු ආදායමෙන් 6.3% | 1978 මුළු ආදායමෙන් 49% |
| 1987 මුළු ආදායමෙන් 5.1% | 1987 මුළු ආදායමෙන් 52% |

මෙම සංඛ්‍යාවලින් පැහැදිලිව පෙන්නුම් කරන්නේ අප රටෙහි මුළු ආදායමෙන් ඉතා විශාල ප්‍රතිශතයක් ජනගහනයෙන් ඉතා කුඩා කොටසක් අතර බෙදී ගොස් ඇති බවය. මෙසේ මුළු ආදායමෙන් ඉතා කුඩා කොටසක් ජනගහනයෙන් ඉතා වැඩි කොටසක් අතර බෙදී යාම නිසා, ජනගහනයෙන් 70% ක් පමණ වූ ජන කොටසකගේ ඒක පුද්ගල ආදායම පහළ මට්ටමක පවතී.

## දිළිඳුබව තුරන් කිරීම

භෞතික සම්පත් හා ප්‍රාග්ධන හිමිකම, තාක්ෂණික දැනුම, ව්‍යවසායකත්ව දැනුම හා කළමනාකාරීත්ව දැනුම නොමැතිකම, අබල දුබලකම, මානසික පසුබෑම හා වෙනත් සාමාජයීය ආර්ථික සාධක නිසා යැපුම් මට්ටමේවත් ආදායමක් ලබාගත නොහැකිකමින් ඇතිවන දරිද්‍රතාවයෙන් පෙළෙන විශාල ජන කොටසක් අප රටෙහි සිටී. දිළිඳුකම නැති කිරීමේ ඕනෑම යෝජනා ක්‍රමයක මූලිකම ලක්ෂණය විය යුත්තේ, ඒ ඒ පවුලෙහි දිළිඳුකම ඇතිවීමට මුල්වූ සාධකයන් හඳුනාගෙන ඒ ඒ සාධකයන්ට අවශ්‍ය වන්නාවූ පිළියම් යෙදීමයි. දිළිඳුබවට හේතු වී ඇත්තේ, සම්පත්, මූල්‍යය, තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ගැටළු පමණක් නම් ඊට පිළියම් යෙදීම පහසුය.

එහෙත් අප ඉදිරියේ ඇති ප්‍රබල අභියෝගයක් වන්නේ ශාරීරික හෝ මානසික දුබලතාව සහ පසුගාමී ආකල්පයන් නිසා දිළිඳුභාවයට පත් අය ඉන් මුදවා ගැනීමයි. මේ සඳහා පුද්ගලයන් තනිවමත්, පවුල් ඒකක වශයෙනුත්, කණ්ඩායම් වශයෙනුත් හඳුනාගෙන පිළියම් යෙදීම අවශ්‍ය වේ. දුබලතාවයට පත් දුප්පතුන් පෝෂණය කිරීම, සෞඛ්‍ය ආදි සේවා සැපයීම මෙහිදී වැදගත් වනු ඇත. මානසික දිළිඳුභාවය තුරන් කිරීම සඳහා දැනුවත් කිරීම, මගපෙන්වීම, දිරිමත් කිරීම හා අධිෂ්ඨානය ඇතිකිරීම අවශ්‍ය වේ. මේ ක්‍රියාදමයන් නොකඩවා ඉදිරියට ගෙන යන ක්‍රියාශීලී වැඩ පිළිවෙළක් සකස් කිරීමද මෙහිදී අත්‍යවශ්‍ය වේ.

මේ අනුව සමෘද්ධි ව්‍යාපාරය මෙතෙක් ක්‍රියාත්මක වූ වැඩසටහන් වලින් වෙනස්වන අතර, පුද්ගලයින්ගේ ස්වශක්තිය, හැකියාවන් හා නිර්මාණශීලි බව කෙරෙහි වඩාත් විශ්වාසය තබනවාක් මෙන්ම, තරුණ තරුණියන් පුළුල් වශයෙන් රටේ ජාතික සංවර්ධන ක්‍රියාවලියට දයක කර ගැනීම ද අරමුණු කරයි.

## සමෘද්ධි ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ පවතින සමාජ හා ආර්ථික ගැටළුවක් වූ දුප්පත්කම නැති කිරීම මූලික අරමුණු කොටගෙන, පවුල් ඒකකය පදනම් කොටගත් සංවර්ධන ව්‍යාපෘති උපයෝගී කර ගනිමින්, ආදායම් හා සමාජයීය තත්ත්වයන් නගා සිටුවීමෙන් දුප්පත්කම පිටුදැකීමටත්, සියයට හතළිහක් පමණ වන තරුණ තරුණියන්, රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට හා පරිපාලනයට සෘජුවම දායක කරගැනීමටත්, රජය විසින් හඳුන්වා දෙන ජාතික සංවර්ධන වැඩසටහන සමෘද්ධි ව්‍යාපාරය ලෙස නම් කර ඇත.

(මෙම වැඩසටහන පිළිබඳව මැතිවරණ ප්‍රකාශනයෙහි 'උද්ධෘතය ඇමුණුම් 01 යටතේ දක්වා ඇත.)

## සමෘද්ධි ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණ :

1. එක් එක් පවුලේ තිබෙන විශේෂ අවශ්‍යතා, කුසලතා, වත්කම් හා අනෙකුත් හැකියාවන් මත හඳුනාගනු ලැබූ පවුල් ඒකකය පදනම් කරගත් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.

2. තම තමන්ගේ ගමෙහි පවුල් ඒකක සඳහාත්, ග්‍රාමීය සහ ප්‍රාදේශිය සංවර්ධන බල ප්‍රදේශ සඳහාත්, අදාළ ව්‍යාපෘතීන් හඳුනාගැනීම, ඒවා ක්‍රියාත්මක කිරීමට සහ රජය අනුමත කරන සුභ සාධක දීමනා බෙදාහැරීමට ආධාර කිරීම, ඒ සඳහා යෝග්‍ය පවුල් තීර්ණය කිරීම වැනි සෑම කටයුත්තකම ගමේ තරුණ, තරුණියන්ගෙන් තේරී පත්වන කණ්ඩායමකට පැවරෙන අතර, මෙම කණ්ඩායම සමෘද්ධි නියාමකයින් ලෙස සලකනු ලබයි. මේ අය අර්ධකාලීන හා පූර්ණකාලීන වශයෙන් වර්ග කෙරෙනු ඇත.

3. තෝරාගත් අඩු ආදායම් ලබන පවුල්වලට සුභසාධන දීමනාවක් රජය මගින් ලබාදෙන අතර, අතිකුත් දිළිඳු පවුල්වලට ඒ ඒ පවුලේ හැකියාව අනුව ආර්ථික කටයුත්තක තිරත කරවීමක්ද අපේක්ෂා කරන බැවින්, සමෘද්ධි වැඩසටහන සුභ සාධනය සමග අත්වැල් බැඳගත් සමුච්චිත සංවර්ධන ක්‍රියාවලියක් වනු ඇත.

4. ආර්ථික සංවර්ධන, සුභසාධන හා අතිකුත් කටයුතු පිළිබඳව ඉහළ සිට පහළට තීරණ ගලායාම වෙනුවට, ග්‍රාමීය මට්ටමේ සිට රාජ්‍ය මට්ටම දක්වා පහළ සිට ඉහළට අදහස්, යෝජනා, තීරණ ගලායාමේ සහ පුළුල් ජනතා සහභාගිත්වය පදනම් කර ගත් සංවර්ධන ක්‍රියාවලියක්, සමෘද්ධි වැඩසටහන මගින් ක්‍රියාවට නඟනු ඇත.

5. පවුල්, ග්‍රාමීය, ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘති තෝරා ගැනීමේදී ප්‍රදේශය තුළ පවතින සම්පත් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.

6. විසිරී ඇති විවිධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් ඒකාබද්ධ කිරීම හා සම්පත් නාස්තිය අවම කිරීම සඳහා දැනට විවිධ රාජ්‍ය අංශ සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් එකම ප්‍රදේශයක විවිධ ස්වරූපයෙන් පවත්වාගෙන යන සංවර්ධන ව්‍යාපෘතීන් අතර, මනා සම්බන්ධීකරණයක් ඇති කිරීමට සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියා කරනු ඇත.

7. සහනාධාර ලබන මෙන්ම නොලබන සෑම අඩු ආදායම් ලබන පවුලකම ආර්ථිකය ඉහළ නැංවීම සඳහා සංවර්ධන ව්‍යාපෘති සැකසීම.

8. පවුල් ඒකක සඳහා ව්‍යාපෘති, සාමූහික ව්‍යාපෘති, සමුපකාර, හවුල් ව්‍යාපාර හා සමාගම් ව්‍යාපෘතීන් සකස් කිරීම.

9. දුප්පත්කම හඳුනාගැනීමේදී නිර්ණායකයන් ලෙසට ආදායම මෙන්ම වියදම හා සම්පත් අයිතීන්ද සැලකිල්ලට ගනු ලැබේ. දිළිඳුකමේ මට්ටම හා සුබසාධන දීමනා ප්‍රමාණය තීරණය කරනු ලබන්නේ ආදායම පදනම් කොටගෙන වුවද, එමගින් ඇතිවන විවිධ විෂමතාවයන් අවමකිරීමටත්, වඩාත් නිවැරදිව දිළිඳුබව තීර්ණය කිරීම සඳහාත්, පවුල සතු විවිධ සම්පත් හා පවුලෙහි වියදම්ද සැලකිල්ලට ගනු ඇත.

10. දුප්පත්කම පිටුදැකීම සඳහා ක්‍රියාකිරීමේදී පවුලෙහි ආර්ථික සංවර්ධනය සඳහා තාක්ෂණික දැනුම, ප්‍රාග්ධන අවශ්‍යතා, උපදේශක සේවා, වෙළඳපොල පහසුකම් හා කළමනාකරණ දැනුම යන ඒවායින් එකක් හෝ කිහිපයක් අවශ්‍ය අවස්ථාවන්හිදී ලබාදීම තුළින් තිරසර ආදායම් මාර්ග ඇති කිරීම.

11. ඵලදායී ස්වයංරැකියා ඇතිකිරීම මගින් ග්‍රාමීය විරැකියාව පිටුදැකීම.

12. සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රතිලාභීන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩවල ගුණාත්මකභාවය කෙරෙහි මෙන්ම, ඒවායේ වෙළඳපොළ කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කිරීම.

13. විදේශීය වෙළඳපොළ අභිමුඛ නිෂ්පාදන සඳහා නිෂ්පාදකයින් දිරිගැන්වීම සහ ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දීම.

14. පුළුල් ලෙස සමාජය දැනුවත් කිරීමේ ක්‍රියාවලියක් තුළින් ග්‍රාමීය, ආර්ථික හා සමාජයීය පදනම ශක්තිමත් කිරීම සහ ග්‍රාමීය ප්‍රජාව බලමුළු ගැන්වීම.

15. යෞවන සමාජ, ක්‍රීඩා සමාජ සහ ග්‍රාම සංවර්ධන සමිති සමෘද්ධි වැඩසටහන සමඟ අනුබද්ධ කිරීම.

16. ග්‍රාමීය අංශයේ ඉතිරි කිරීම වැඩිකිරීමට දිරිගැන්වීම සහ අඩු ආදායම්ලාභී පවුල්වල මූල්‍ය අවශ්‍යතා සැපයීම සඳහා මූල්‍ය සේවා පද්ධතියක් සමෘද්ධි බැංකුව යටතේ ක්‍රියාත්මක කිරීම.

17. නිර්මාණශීලී නව නිෂ්පාදන බිහිකිරීමට උනන්දු කරවීම.

18. සමෘද්ධි බලකාය සම්පත් මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරනු ඇත. විවිධ ආයතන හා ව්‍යාප්ති සේවා මගින් ලබාදෙන සියලුම සේවාවන් සමෘද්ධි බලකාය මගින් ගමට ලබාදෙනු ඇත.

19. නිලධාරීන් හා ප්‍රතිලාභීන් අතර සම්බන්ධතාව ගොඩනැඟීම තුලින්, පවත්නා ව්‍යාප්ති සේවා ඇතුළු සහාය සේවා පද්ධතියේ සියළුම සේවාවන් ග්‍රාමීය සංවර්ධනය සඳහා කාර්යක්ෂමව යොදා ගැනීම.

20. ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක වන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල අත්දැකීම්, තාක්ෂණය, ශිල්පීය දැනුම, කළමනාකරණ හා පරිපාලන හැකියාවන් සමෘද්ධි ව්‍යාපාරය සඳහා දායක කර ගැනීමට, ඔවුන්ගේ සහාය හා ආධාර ලබා ගැනීම.

## දිළිඳු පවුල් හඳුනා ගැනීම

**දරිද්‍රතාවයෙන් පෙලෙන පවුල් එම දරිද්‍රතාවයට හේතු පාදක වන සාධක මත ප්‍රධාන වශයෙන් පහත සඳහන් ලෙස වර්ග කළ හැකිය.**

I. වයෝවෘද්ධ හෝ අංගවිකල අය පමණක් ඇති, වැඩකිරීමේ හැකියාව නොමැති දුප්පත් පවුල්.

II. මව හෝ පියා පමණක් සමඟ කුඩා දරුවන් ඇති දුප්පත් පවුල්.

III. ඇබ්බැහිවීම හා මානසික පසුබෑම් මත වැඩ නොකරන දුප්පත් පවුල්

IV. වැඩකිරීමේ හැකියාව හා උනන්දුව ඇති දුප්පත් පවුල්

V. ප්‍රමාණවත් සම්පත් නැති පවුල්

විවිධ සාධක මත දිළිඳුභාවයට පත් සියලුදෙනාම සඳහා දුප්පත්කම පිටුදැකීමේ පොදු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම එතරම් ඵලදායක නොවනු ඇත. මේ නිසා පවුල් සමූහ වශයෙන් හෝ තනි තනිව හෝ හඳුනාගෙන ඔවුන්ට යෝග්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා අවශ්‍ය වෙනත් ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතීන්ද බිහිවනු ඇත.

## දිළිඳුකම තුරන් කිරීම සඳහා සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වන්නේ කවර පවුල් සඳහාද?

දුප්පත්කම පිටුදැකීමේ පුළුල් ක්‍රියාවලියකට ඵලදායි ලෙස සහභාගී කරවාගත හැක්කේ, දිළිඳු බවින් මිදීම සඳහා ව්‍යාපෘතිවල නිරතවිය හැකි හා ඒවායේ යෙදීමට කැමැත්තක් දක්වන සහ දැනුවත් කිරීම මගින් ආකල්පයම වෙනසක් ඇති කළ හැකි පවුල් පමණි. වයෝවෘද්ධ හා අංගවිකල අය පමණක් ඇති, වැඩකිරීමේ හැකියාවක් නොමැති දුප්පත් පවුල් සංවර්ධන ක්‍රියාවලියකට සහභාගීකරවා ගැනීම අපහසුවෙයි. මෙවැනි පවුල් සඳහා සුභසාධන දීමනා ලබාදීමට කටයුතු කෙරේ.

ඉහතින් විස්තර කර ඇති පළමු පවුල් කොටසට ඇතුළු නොවන සියලු පවුල් ඵලදායි ආර්ථික කටයුතුවලට දායක කරගත හැකි අය වශයෙන් මූලිකව සැලකිල්ලට ගත හැකිය. එම පවුල් කාණ්ඩ සවිස්තරාත්මකව පහත සඳහන් අයුරෙන් බෙදිය හැකිය.

I. දැනට දිළිඳු තත්ත්වයේ පසුවන සහ ආර්ථික සම්පත් හිඟකම (භූමිය, ප්‍රාග්ධනය වැනි) නිසා දිළිඳුභාවයට පත්ව ඇති පවුල්

II. සම්පත් ඇතත් තාක්ෂණ ඥානය නොමැතිකම නිසා දිළිඳුබවට පත්ව ඇති පවුල්

III. සම්පත් ඇතත් අවශ්‍ය අනෙකුත් ව්‍යාප්ති සේවා ආදී සහායයන් ප්‍රමාණවත් නොලැබීම නිසා දිළිඳුබවට පත්ව ඇති පවුල්

IV. සම්පත් හිඟ ඵලදායි කාර්යයක නිරතකරවිය හැකි පවුල්

V. ගෙවතු හා ගෘහ කටයුතු පමණක් යෙද විය හැකි පවුල්.

VI. මූල්‍ය හා වෙළඳපොළ අපහසුතා නිසා දිළිඳුබවට පත්ව ඇති පවුල්.

VII. මානසික හා ශාරීරික පසුබෑම් ඉවත්කර ඵලදායක ලෙස ඉදිරියට පැමිණවිය හැකි පවුල්.

VIII. කළමනාකරණ දක්ෂතා නොමැතිකමින් දිළිඳු බවට පත්ව ඇති පවුල්.

## සමෘද්ධි වැඩපිළිවෙළ යටතේ දුප්පත්කම හඳුනාගැනීමට හා ඔවුනට ආධාර කිරීමට සකස් කර ඇති සරල අත්වැලක්

| දිළිඳු පවුල් වර්ගීකරණය | දිළිඳුබව තුරන් කිරීමට ගතහැකි උපාය මාර්ග |
| --- | --- |
| 1. වයෝවෘද්ධ හෝ අංග විකල අය පමණක් ඇති, වැඩකිරීමේ හැකියාවක් නැති දුප්පත් පවුල් | i සමාජ සුබසාධන දීමනා |
| 2. දරුවන් සමග තනිවූ මව හෝ පියා පමණක් ඇති පවුල් | i සමාජ සුබසාධන දීමනා<br>ii ගෘහ කර්මාන්ත සඳහා අවශ්‍ය සහාය හා වෙළඳපොළ පහසුකම්<br>iii ගෙවතු නිෂ්පාදනවලට ආධාරකිරීම.<br>iv ළමා සුබසාධන පහසුකම්. |
| 3. සම්පත් නොමැති හා රැකියාවක් සඳහා පුහුණුවක් ද, ප්‍රමාණවත් අධ්‍යාපනයක්ද, නොමැති පවුල් | i. දැනට නිරත වන ආදායම් මාර්ග හෝ නිෂ්පාදන කාර්යය ක්‍රමවත් කර ආදායම වැඩිකර ගැනීමට ආධාර දීම.<br>ii. ප්‍රවිෂ්ටවීමට දැඩි උනන්දුවක් දක්වන අංශයක් ඇතොත් ඒ සඳහා අවශ්‍ය සහාය ලබාදීම.<br>iii. සරල තාක්ෂණය සහිත රැකියා සඳහා පුහුණුව ලබාදීම.<br>iv. කිසිදු පුහුණුවක් අවශ්‍ය නොවන උපකාරක සේවා සඳහා සුදුසු රැකියා අවස්ථා ලබාදීම.<br>v. පුහුණුව අවසානයේ රැකියා අවස්ථාවක් ලැබෙන තෙක් සුභසාධන දීමනාවක් ලබාදීම. |

| | |
|---|---|
| 4. දන උගත්කම් යම් ප්‍රමාණයකට ඇති රැකියාවක නිරතවීමට කැමති දුප්පත් පවුල් | i. සාමාන්‍ය මට්ටමේ තාක්ෂණ අවශ්‍යතා සහිත රැකියා සඳහා පුහුණුවක් ලබාදීම.<br>ii. තමන් කැමති රැකියා අභිමුඛ පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම.<br>iii. ආයතන වලට අනුයුක්ත කොට ආයතනයේ අවශ්‍යතා අනුව පුහුණු කරවා ගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම.<br>iv. ආයතන වලට අනුයුක්ත කොට ආයතනයේ අවශ්‍යතා අනුව පහසුකම් ලබාදීම.<br>v. උප කොන්ත්‍රාත් රැකියාවලට යොමුකිරීම. |
| 5. දන උගත්කම් යම් ප්‍රමාණයකට ඇති එහෙත් නිෂ්පාදන හෝ ව්‍යාපාර කටයුත්තක යෙදීමට නොහැකි දිළිඳු පවුල්. | i. මෙ අයගේ උවමනාවන් අනුව අවශ්‍ය ආධාර උපකාර සුපරීක්ෂාකාරීව ලබාදීම. |
| 6. උගත් නමුත් රැකියා/ආදායම් නොමැතිකම නිසා දිළිඳුබවට පත්ව ඇති පවුල් | i. කලමනාකරණ පුහුණුව ලබාදීම.<br>ii. ඉංග්‍රීසි/පරිගනක තාක්ෂණය වැනි පුහුණුවක්ලබාදීම.<br>iii. ආයතනවලට යොමු කර ආයතන අවශ්‍යතා අනුව පුහුණු කරගත හැකිවන පරිදි දීමනා ක්‍රමයක් ආරම්භ කිරීම.<br>iv. ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම සඳහා අවශ්‍ය මධ්‍යම මට්ටමේ කළමනාරණ සුපරීක්ෂණ/ව්‍යාපෘති නිලධාරීන් ලෙස යොදා ගැනීම.<br>v. ප්‍රාග්ධන පහසුකම් සැපයීම. |

| | |
|---|---|
| 7. ආර්ථික සම්පත් යම ප්‍රමාණයක් ඇති නමුත් ඒවා ඵලදයි ලෙස යොදගැනීමට අපහසුවීමෙන් දිළිඳු වී ඇති පවුල් | i. ව්‍යාපෘති සේවා විධිමත්ව ලබාදීම.<br>ii. සම්පත් පරිහරනය පිළිබඳව ක්‍රමවත්ව දැනුමක් ලබාදීම.<br>iii. කළමනාකාරිත්ව දැනුම ලබාදීම.<br>iv. මූල්‍ය පරිපාලනය විධිමත්ව·පවත්වා ගැනීමට උපකාරිවීම.<br>v. මූල්‍ය හා වෙළඳ පහසුකම් ලබාදීම.<br>vi. තාක්‍ෂණ ඥානය ලබාදීම. |
| 8. සම්පත් ඇතත් වෙළඳපොළ හා මූල්‍ය අපහසුතා නිසා තාවකාලිකව දිළිඳු බවට පත් අය. | i. කළමනාකරණ අවබෝධය ලබාදීම.<br>ii. වෙළඳපොළ පහසුකම් ඇතිකර දීම.<br>iii. මූල්‍ය පහසුකම් ඇතිකර දීම.<br>iv. නිෂ්පාදන හා කාර්මික ඥානය ලබාදීම. |
| 9. සම්පත් ඇතත් සමාජ ආකල්ප නිසා දිළිඳු බවට පත්ව ඇති පවුල්. | i. මෙ අය පහසුවෙන් යොමුකල හැකි අංශය ගැන නිවැරදිව අවබෝධ කරගැනීම.<br>ii. ආකල්ප වෙනස් කිරීම සඳහා කටයුතු කිරීම.<br>iii. ආත්ම විශ්වාසය ගොඩනැගීම.<br>iv. ස්වයං රැකියා හෝ රැකියා සඳහා දිරිදීම හෝ පෙළඹවීම.<br>v. ඔහු යොමුවන කාර්යය ගැන සුපරීක්‍ෂාවෙන් සිටීමෙන් උපකාර කිරීම.<br>vi. දැනුවත් කිරීමේ වැඩසටහන් වලට ඇතුලත් කිරීම. |

## සමෘද්ධි වැඩසටහනෙහි සංවිධාන ව්‍යුහය

විවිධ පරිපාලන මට්ටම් වලදී සමෘද්ධි ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය ගොඩනැගෙන අයුරු පහත දැක්වෙන පරිදි වේ.

### ග්‍රාමීය සමෘද්ධි බලකාය

1. සමෘද්ධි ව්‍යාපාරය පහළ සිට ඉහළට වර්ධනය වන සංවර්ධන ක්‍රියාවලියකි. එබැවින් සංවිධාන රටාවද ඊට අනුරූපව ගොඩනැගෙනු ඇත. සමෘද්ධි ව්‍යාපාරයේ ග්‍රාමීය මට්ටමේ සංවිධානය ග්‍රාමීය සමෘද්ධි බලකාය යනුවෙන් නම් කෙරේ.

2. සෑම ග්‍රාම නිළධාරි වසමකටම ග්‍රාමීය සමෘද්ධි බලකායක් බැගින් පිහිටුවනු ඇත. අදාල ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ ස්ථිර පදිංචියක් ඇති, අවුරුදු 18-35 අතර සියලු දෙනා සමෘද්ධි බලකායේ නිත්‍ය සමාජිකත්වයට සුදුසුකම් ලබති.

3 විශාල වතුකර ප්‍රදේශවලදී ග්‍රාම නිළධාරී වසම වෙනුවට ග්‍රාමීයසමෘද්ධි බලකායපිහිටුවීමේ භූගෝලීය පදනම ලෙස, එකි වතු ඒකක සලකනු ඇත.

4. ග්‍රාමීය සමෘද්ධි බලකායේ සේවය සඳහා අදල ග්‍රාම නිලධාරි වසමෙහි, ස්ථිර පදිංචිය ඇති වයස අවුරුදු 18-35 අතර වූ, තරුණ තරුණියන් දස දෙනෙකුගෙන් සැදුම්ලත් නියාමක කණ්ඩායමක් තරුණ තරුණියන්ගේ ඡන්දයෙන් තේරීපත්වනු ඇත.

5. මෙම දස දෙනා ග්‍රාමීය පදනමේ විධායක සභාවද වේ.

6. ග්‍රාමීය සමෘද්ධි බලකායේ විධායක සභාවට පත්වන සමාජිකයන් තිදෙනෙකු දැනට තාවකාලිකව හඳුනාගෙන

ඇති අතර, ඉහත සඳහන් සුදුසුකම් ඔවුනට ද එකසේ බලපානු ඇත.

7. දැනටමත් හඳුනාගෙන ඇති නියාමකයින් තමන් නියෝජනය කරන ග්‍රාමනිලධාරි වසම් තුළ, සමෘද්ධි බලකායේ විධායක කමිටුව සඳහා ඉතිරි නියාමකයින් හත්දෙනා තෝරාගැනීමට සහ උපදේශක කමිටුවක් පහත අන්දමට ඡන්දයෙන් පිහිටුවා ගැනීම සඳහා ක්‍රියාකළ යුතුවේ.

8. මෙම විධායක කමිටුවට පත්වන දසදෙනාගෙන් තිදෙනෙකු මීළඟ විධායක කමිටුව පත්වනතුරු පූර්ණකාලීනව ක්‍රියා කරනු ඇත.

9. දැනට හඳුනාගෙන ඇති සමෘද්ධි නියාමකයින් විසින් අදාල ග්‍රාම සේවා වසමතුළ ප්‍රසිද්ධ ස්ථානයක ජනහමුවක් පවත්වා, එහිදී සෙසු සමාජිකයින් හත්දෙනා තෝරා ගැනීමට කටයුතු කළයුතුවේ. එසේ කැඳවනු ලබන ජනහමුවට ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර අධ්‍යක්‍ෂ (සැලසුම්) හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයකු ලෙස ග්‍රාමනිළධාරී මහතා නිල වශයෙන් සහභාගී වන අතර, ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරුවන් විසින් එකී සමස්ත ක්‍රියාවලියම දැඩි ලෙස සුපරීක්‍ෂා කිරීමටත්, ජන හමුව සාධාරණ ලෙසත්, ප්‍රජාතන්ත්‍රවාදී ලෙසත් පැවැත්වීමට ක්‍රියාකරනු ඇත.

10. ඉහත නමවන වගන්තිය යටතේ කැඳවනු ලබන රැස්වීම පැවැත්වෙන දිනය, ස්ථානය සහ වේලාව පිළිබඳව යටත් පිරිසෙයින් සතියකට පෙර හෝ ගම්වාසීන්ට ප්‍රසිද්ධ දැන්වීම් මගින් දැනුම් දිය යුතුවේ. එකී රැස්වීම පිළිබඳව පුළුල් ප්‍රචාරයක් අදල ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුළ සිදුකළ යුතු අතර, නියාමකයින් තෝරා ගතයුත්තේ අදල ග්‍රාම නිලධාරී

වසමේ අවුරුදු 18-35 ත් අතර ස්ථිර පදිංචිකරුවන් බහුතරයක් සහභාගී වී සිටින බවට, එම රැස්වීමට නිල වශයෙන් සහභාගි වන නිලධාරීන් සෑහීමකට පත් වන්නේ නම් පමණි.

11. පත්වූ දින සිට මාස හයක් ඉකුත්වීමට ප්‍රථමයෙන් අදාල ග්‍රාමීය සමෘද්ධි බලකාය නැවත කැඳවා දසදෙනෙකුගෙන් සමන්විත මුළු විධායක සභාව දෑවුරුදු කාලයක් සඳහා, නැවත ඡන්දයෙන් තෝරාපත්කර ගතයුතුවේ.

12. මෙම විධායක කමිටුවට පත්වන දසදෙනාගෙන් තිදෙනෙකු පූර්ණකාලීන වශයෙන් පරීක්ෂණයක් මගින් තෝරා ගනු ඇත.

## සමෘද්ධි බලකායේ නියාමකයින්ගේ කටයුතු

1. සමෘද්ධි බලකායට පත්වන නියාමකයින් සිය බල ප්‍රදේශයේ පොදු සංවර්ධන ක්‍රියාවලියට නායකත්ව සපයන ස්වේච්ඡා සේවක පිරිසක් ලෙස සලකනු ලබයි.

2. සමෘද්ධි බලකායට පත්වන නියාමකයින් මේ රටේ සංවර්ධනයට ක්‍රියාකාරී ලෙස සහභාගී වීමට සාමාන්‍යයෙන් අවස්ථාවක් නොලබන, එහෙත් ඒ සඳහා ස්වේච්ඡාවෙන්ම කැපවීමට කැමති, සමාජශීලී තරුණ තරුණියන්ගෙන් සැදුම් ලබයි. ඔවුන් තමාගේ ක්‍රියාකාරීකම් තුලින් ප්‍රජා නායකයින් බවට පත්වී, ග්‍රාමීය සංවර්ධනයට දයකවනු ඇත.

3. සමෘද්ධි බලකායට පත්වන නියාමකයන්ටද ග්‍රාමීය මට්ටමේ පවුල් ඒකක පදනමකරගත් ව්‍යාපෘතිවලට ඇතුලත්වීමට අවස්ථාව ලබාගත හැකිය.

## සමෘද්ධි බලකායේ නියාමකයින්ගේ කාර්යභාරය

1. ගමේ සහ එහි ජීවත්වන පවුල්වල දුගීබව හා එයට හේතු අවබෝධ කර ගැනීම.

2. තර්කානුකූල ලෙස මේ සඳහා විසඳුම් සෙවීම.

3. ග්‍රාමීය මට්ටමේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම, මෙහෙයවීමට දයකවීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය සහ අගැයීම.

4. පවුල් ඒකක පදනම් කරගත් ව්‍යාපෘතින් හඳුනාගැනීම, ක්‍රියාත්මක කිරීමට සහය වීම, අධීක්ෂණය සහ අගැයීම.

5. සිය බල ප්‍රදේශයතුළ ක්‍රියාත්මක වන යෞවන, ක්‍රීඩා, ග්‍රාම සංවර්ධන සහ අනෙකුත් සංවිධාන සමග මනා සම්බන්ධතාවයක් ගොඩනගාගැනීමටත් ප්‍රජාවගේ දැනුම, අධ්‍යාපනික, ක්‍රීඩා, නිර්මාණ කුසලතා සහ සමාජයීය සංස්කෘතික, ආගමික පදනම පුලුල් කිරීම සඳහාත් ඒකාබද්ධව ක්‍රියා කිරීම.

6. ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන්ට නව ආදයම් මාර්ග සහ ස්වයං රැකියා සපයාගැනීමට ප්‍රයෝජනවත්වන තාක්ෂණික, මූල්‍ය හා කළමනාකරණ දැනුම ලබාගැනීමට ඔවුන් යොමුකිරීම.

7. ග්‍රාමීය සමෘද්ධි උපදේශක කමිටුවේ උපදෙස් හා මගපෙන්වීම් කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කිරීම.

8. ගමට අවශ්‍ය සේවාවන් සෘජුව හෝ කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය හරහා ලබාගැනීමට සහ වෙනත් අවශ්‍යතාවයන් ඇතොත් සමෘද්ධි ආයතනවලට දැනුම්දීම.

9. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය නියෝජනය කිරීම සඳහා තමන් අතුරින් එක් අයකු වසර දෙකක කාලයක් සඳහා තෝරා යැවීම.

10. සමෘද්ධි බලකාය සඳහා සමෘද්ධි උපදේශක කමිටුවේද සහාය ඇතිව මෙම තීර්නායකයන්ට පටහැනිනොවන පරිදි ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම හා ඒ අනුව ක්‍රියා කිරීම.

11. ගමේ සමස්ථ සංවර්ධනයේ නියාමකයින් ලෙස ක්‍රියාකිරීම සහ තරුණ නායකත්වය පිළිබඳ පරමාදර්ශයක් සමාජයට සැපයීම.

12. ආදර්ශවත් සමෘද්ධි සංවර්ධන වැඩ පිළිවෙළක් තම පවුල් ඒකකය තුලින් ක්‍රියාවට නැංවීම.

## සමෘද්ධි බලකායේ නියාමක ඇබෑර්තු පිරවීම:

1. සමෘද්ධි නියාමකයින් ලෙස පත්වන ඕනෑම තරුණ/තරුණියකට තමා කැමති ඕනෑම විටෙක සිය පදවියෙන් ඉල්ලා අස්විය හැකිය. එහෙත් එවැනි අවස්ථාවකදී ඔහු හෝ ඇය අදල සමෘද්ධි බලකායේ ව්‍යවස්ථාවේ විධි විධානයන් පිළිපැදීමට බැඳී සිටී.

2. සමෘද්ධි නියාමක කණ්ඩායමක යම් ඇබෑර්තුවක් ඇතිවූ විට අදළ සුදුසුකම් ඇති අයකු, අනෙකුන් නියමයන්ට යටත්ව අංක නමයේ සහ දහයේ සඳහන් පරිදි තෝරා ගැනීම කළ හැකිය.

## සමෘද්ධි බලකායේ නියාමකයින්ගේ තනතුරු අහෝසිකිරීම:

1. යම්කිසි නියාමකයකු සිය සේවාව ඉටුකිරීම පැහැර හරින්නේ නම් හෝ සමෘද්ධි බලකායේ ව්‍යවස්ථාවට පටහැනිව ක්‍රියාකරන්නේ නම් හෝ සමෘද්ධි ව්‍යාපාරයේ මූලික අරමුණු ඉටුකිරීමෙහිලා උපරිම අයුරින් සිය සේවාව ඉටුකිරීමට අපොහොසත්වන්නේ නම් හෝ සමෘද්ධි බලකායේ සමාජිකයින් විසින් ඔහුගේ හෝ ඇයගේ නියාමක ධූරය අවලංගු කිරීම සඳහා, කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය මගින් ඉහළ සංවිධාන වෙත නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

2. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය විසින් උපදේශක මණ්ඩලයේ අදහස් විමසා සිය තීරණය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දැනුම් දෙනු ඇත.

## ග්‍රාමීය සමෘද්ධි බලකායේ ව්‍යවස්ථාව

මෙම ලේඛනයේ දැනට දක්වා ඇති සහ ඉදිරියේදී සමෘද්ධි අධිකාරිය හෝ සමෘද්ධි කොමසාරිස් ජනරාල් කාර්යාලය විසින් දැනුම් දෙනු ලබන මූලික ප්‍රතිපත්ති සහ නිර්ණායකයන්ට අනුකූලව සුදුසු ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීමේ බලය එක් එක් සමෘද්ධි බලකායට පැවරෙනු ඇත.

## ග්‍රාමීය සමෘද්ධි උපදේශක මණ්ඩලය

1. මෙම ලේඛනයේ ග්‍රාමීය සමෘද්ධි බලකායේ නියාමකයින්පත්කර ගැනීම සඳහා දක්වා ඇති නියමයන් පරිදි පැවත්වෙන ජනහමුවේදීම අදාළ සමෘද්ධි බලකාය වෙනුවෙන් හත්දෙනෙකුගෙන් යුත් උපදේශක මණ්ඩලයක්ද නම් කර ගතයුතු වේ.

2. ග්‍රාමීය සමෘද්ධි බලකායේ උපදේශක මණ්ඩලයට නම් කරන අය ග්‍රාම නිළධාරි වසම තුළ ස්ථිර පදිංචියක් ඇති අය විය යුතුය. මෙම උපදේශක මණ්ඩලය, උගතුන්, අත්දැකීම් ඇති සමාජශීලී වැඩිහිටියන්, ප්‍රජා නායකයින්, අනෙකුත් රාජ්‍ය නොවන සංවිධාන ආදිය නියෝජනය කරන පුද්ගලයින්, සහ පූජ්‍ය පක්ෂය අතරින් තෝරාගත් අයගෙන් සමන්විත විය යුතුවේ.

3. අවශ්‍යයැයි හැඟෙන්නේ නම් ග්‍රාමීය සමෘද්ධි උපදේශක සභාවට, අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් අමතර උපදේශකයකු හෝ කිපදෙනෙකු හෝ බල ප්‍රදේශයතුළින් පත්කරනු ලැබේ.

4. උපදේශක සභාවේ එක් සමාජිකයකු එහි සභාපති විය යුතු අතර, ප්‍රදේශයේ අදාළ ග්‍රාම නිළධාරී මහතා ලේකම් ලෙස ක්‍රියාකරනු ඇත.

## ග්‍රාමීය සමෘද්ධි උපදේශක මණ්ඩල සමාජිකයන්ගේ කාර්යභාරය ;

1. සිය ග්‍රාම නිළධාරි වසම තුළ ක්‍රියාත්මක වන සමෘද්ධි බලකායට අයත් නියාමක කණ්ඩායමට අවශ්‍ය උපදෙස්දීම හා මග පෙන්වීම.

2. සමෘද්ධි බලකායේ ව්‍යවස්ථා සම්පාදනයේදී අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබාදීම.

3. සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක වීමේදී ප්‍රජාතන්ත්‍රවාදීව හා සාධාරණ අයුරින් සමෘද්ධි බලකාය ක්‍රියාත්මකවන්නේද යන්න සොයා බැලීම.

4. සමෘද්ධි ව්‍යාපාරය හා සම්බන්ධ ගැටළු සොයාබලා ඒවා සමථයකට පත් කිරීම සහ ඉහළ සමෘද්ධි උපදේශක මණ්ඩල වලට සුදුසු නියෝජිතයින් තෝරා යැවීමට කටයුතු කිරීම.

## කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය :

1. ග්‍රාම සේවා නිළධාරි වසම්තුළ ක්‍රියාත්මක වන සමෘද්ධි බලකායයන් 10-15 ක් පමණ ඒකරාශි වීමෙන් කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය බිහිවේ. ඒ අනුව කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය යනු සෘජුව නියාමකයින් තේරී පත්වන මණ්ඩලයක් නොවන අතර, සමෘද්ධි බලකායයන් කිහිපයක් ඒකාබද්ධ වීමෙන් ඇතිකරනු ලබන නියෝජිත ආයතනයකි.

2. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානයකට අයත් වන සියලුම සමෘද්ධි බලකායයන්ගෙන් එක් නියෝජිතයකු බැගින් ඊට නම් කළයුතුවේ. මේ අනුව කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය සිය බල ප්‍රදේශයේ ඇති සියලුම සමෘද්ධි බලකායයන් සමග සම්බන්ධීකරණයක් පවත්වනු ඇත.

3. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානයට තේරී පත්වන්නන්ගේ නිලකාලය අවුරුදු දෙකක් වන අතර, ඔහු/ඇය සෑමවිටෙකම ග්‍රාමීය සමෘද්ධි බලකායේ නියාමක කණ්ඩායමේ නියෝජිතයකු විය යුතුය.

4. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානයක සම්බන්ධීකරණ නිලධාරියා ලෙසට කලාපීය සමෘද්ධි කළමනාකරුවකු කටයුතු කරනු ඇත. උපාධිධාරි අභ්‍යාසලාභීන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති උපාධිධාරීන් කණ්ඩායමක් දැනට ප්‍රාදේශීය සමෘද්ධි කළමණාකරුවන් වශයෙන් සේවය කිරීමට තෝරාගෙන ඇත. ඔවුන්ගේ කැපවීම හා කාර්යක්ෂමතාවය අනුව ස්ථිර සේවයට පත් කිරීමටත් නව දුරටත් ඔවුන් විසින් දක්වනු ලබන

දක්ෂතාවයන් අනුව සමෘද්ධි ව්‍යාපාරයේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් මෙහෙයවීමේ කාර්යය සඳහා මැදිහත් කරවා ගැනීමටත් සැලසුම් කර ඇත.

5. කලාපයතුළ සේවය කරන රාජ්‍ය අංශයේ ව්‍යාප්ති නිලධාරීන්ගේද, කලාපයතුළ සේවය කරන රාජ්‍ය නොවන සංවිධානවලද සහාය කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය විසින් ලබා ගැනීමට ක්‍රියාකරනු ඇත.

## කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානයේ සහ ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරුවන්ගේ කාර්යභාරය

1. කලාපයට උචිත සමෘද්ධි සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම.
2. පවුල් සංවර්ධන ව්‍යාප්තිවලට අදාළ යටිතල පහසුකම් ලබාදීම.
3. කලාපය තුළ ක්‍රියාත්මක කලයුතු සංවර්ධන අවශ්‍යතා ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීම.
4. කලාපයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන ව්‍යාප්ති සේවාවන් හා රාජ්‍ය නොවන ආයතනවල සේවා, පුහුණු හා වෙනත් පහසුකම් සමෘද්ධි බලකායවලට යොමුකිරීම.
5. කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය යටතේ තිබෙන සමෘද්ධි බලකායයන් පිළිබඳ අධීක්ෂණය හා ඒවා නායකත්ව සැපයීම.
6. සමෘද්ධි මූල්‍ය සේවාවන් වැඩසටහන්වලට ලබාදීම.
7. අදල සමෘද්ධි බලකායයන් සම්බන්ධව පැනනගින ගැටළු විභාගකිරීම. සමෘද්ධි බලකායයන් වලින් ලැබෙන යෝජනා හා තීරණ අදළ ඉහළ ආයතනවලට යොමුකිරීම හා තිසි ක්‍රියාමාර්ග ගැනීම.

8. සමෘද්ධි වැඩ සටහනෙහි ඉලක්කයන් කරා පහසුවෙන් ළඟා විය හැකිවන පරිදි සමෘද්ධි නියාමකයින් පුහුණු කිරීමත්, ඔවුනට නිසිමඟ පෙන්වීම සහ කළමනාකරණය.

## කලාපීය සමෘද්ධි උපදේශක කමිටුව

1. කලාපීය සමෘද්ධි උපදේශක කමිටුවට අදාළව කලාපයට අයත් සෑම සමෘද්ධි බලකායකම උපදේශක මණ්ඩලවලින් එක් නියෝජිතයකු බැගින් තෝරා පත්කර ගනුලබයි. එබැවින් කලාපීය උපදේශක කමිටුවට සෘජුව උපදේශකයින් පත්නොවන අතර, එයද නියෝජිත මණ්ඩලයකි.

2. කලාපීය සමෘද්ධි උපදේශක මණ්ඩලය කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානයේ කටයුතු සඳහා උපදෙස් දීම හා මඟ පෙන්වීම කරනු ලබන අතර, ග්‍රාමීය මට්ටමේ සමෘද්ධි උපදේශක කමිටුව විසින් ක්‍රියාත්මක කරන්නාවූ සියලු බලතල කලාපීය මට්ටමින් කරනු ලබයි.

## ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටුව

1. ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටුවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ අදාළ නිලධාරීන් අයත්වන අතර, ප්‍රාදේශීය ලේකම් එහි සභාපතිත්වය දරයි.

2. ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටු සමාජිකයින් ලෙස ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), සමෘද්ධි මූලාසේවා නිලධාරී, ප්‍රාදේශීය සමෘද්ධි කළමනාකරුවන්, ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් දෙදෙනෙකුද ඇතුලත්වන අතර නිලවශයෙන් කලාපීය සමෘද්ධි මධ්‍යස්ථාන එකකින්, එක් සමෘද්ධි නියාමක නියෝජිතයෙකු සහ කලාපීය සමෘද්ධි උපදේශක කමිටුවෙන් එක් නියෝජිතයෙකු බැගින් සහභාගිවනු ඇත.

3. අදාල බල ප්‍රදේශයේ පළාත්පාලන ආයතනවල සභාපති/නගරාධිපති හා විපක්ෂනායකවරුන්ට මේ කමිටුවට සහභාගිවී සිය අදහස් ප්‍රකාශ පළකිරීමේ අවකාශ ඇත.

4. ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටුවට අවශ්‍ය යැයි හැඟෙන ඕනෑම නිලධාරියෙකු කැඳවීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත හිමිවේ.

5. ප්‍රාදේශීය සමෘද්ධි සම්බන්ධීකරණ කමිටුව විසින් මූලික වශයෙන් එම බල ප්‍රාදේශයතුළ ක්‍රියාත්මක වන කලාපීය සමෘද්ධි මධ්‍යස්ථානය සහ ග්‍රාමීය සමෘද්ධි බලකායයන් වලට අවශ්‍ය සේවාවන් හා පහසුකම් පිළිබඳ සම්බන්ධීකරණය කිරීමත්, සමෘද්ධි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලුම පහසුකම්, සභායයන් හා සේවාවන් සිය ප්‍රදේශයට ලබා දීමත්, ඒවායේ මූල්‍ය පරිපාලනය අධීක්ෂණයට ක්‍රියාකිරීමත් කරනු ඇත.

6. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අවශ්‍ය තොරතුරු සැපයීමද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත පැවරේ.

## දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව

1. ප්‍රාදේශීය මට්ටමේදී ඉදිරිපත්වන අවශ්‍යතා සහ ගැටලු විසඳීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පත් කෙරේ.

2. මෙම කමිටුවේ සභාපති දිස්ත්‍රික් ලේකම් වේ. ලේකම් වශයෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂක (සැලසුම්) / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) කටයුතු කරනු ලැබේ.

3. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සමාජිකයින් ලෙස ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය උපදේශක කමිටු නියෝජිතයකු, සමෘද්ධි ප්‍රාදේශීය කළමනාකරුවකු, සහ පූර්ණ කාලීන සමෘද්ධි නියාමකයකුද අයත් වේ.

4. අදල දිස්ත්‍රික්කයේ සියලුම පාර්ලිමේන්තු හා පළාත් සභා මන්ත්‍රීවරුන්ටද මෙම කමිටු රැස්වීම්වලට සහභාගී වී සිය අදහස් ප්‍රකාශ කිරීමට අවකාශ ඇත.

5. කමිටුවේ සෙසු සාමාජිකයින් ලෙස සමෘද්ධි අධිකාරියේ දිස්ත්‍රික් නිලධාරීන්, අදළ රාජ්‍ය දෙපාර්තමේන්තු/ ආයතනවල නිලධාරීන් කටයුතු කරනු ඇත.

6. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩසටහන සහ අතිකුත් දුගී දුප්පත්කම තුරන්කිරීම මුල්කර ගත් සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය උපදෙස් දීම, මගපෙන්වීම, ඉදිරිපත් වන ගැටළුවලට විසඳුම් ඉදිරිපත් කිරීම, දිස්ත්‍රික් සම්බන්ධකරණ කමිටුවේ කාර්යභාරය වේ.

7. දිස්ත්‍රික්කය තුළ, සමෘද්ධි වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ප්‍රගතිය විටින් විට සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කිරීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ වගකීම වේ.

## ජාතික සමෘද්ධි මෙහෙයුම් කමිටුව

1. අතිගරු ජනාධිපතිතුමිය, ගරු අග්‍රාමාත්‍යතුමිය, සමෘද්ධි ව්‍යාපාරය භාර ගරු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, එකී අමාත්‍යංශ ලේකම්, අදල සියලුම අමාත්‍යංශවල ලේකම්වරුන්, සමෘද්ධි ජාතික උපදේශකවරුන්, සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් සහ සමෘද්ධි ජාතික සම්මේලනයේ සභාපති හා ලේකම්ගෙන් සමෘද්ධි මෙහෙයුම් මණ්ඩලය සංයුක්ත වේ.

2. ජාතික සමෘද්ධි මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය සඳහා වෙනත් ආයතන හා නියෝජිතයින් අවශ්‍ය පරිදි නම් කිරීම, ගරු ජනාධිපතිතියගේ නිර්දේශය මත විෂයභාර අමාත්‍යවරයා විසින් සිදුකරනු ඇත.

3. මෙම මෙහෙයුම් කමිටුවට, සෑම පළාත් සභාවකම ප්‍රධාන ලේකම් වරුන්ද අයත් වේ.

## සමෘද්ධි අධිකාරිය

1. අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සහ විෂයභාර අධ්‍යක්ෂවරු හයදෙනෙකු මගින් සමෘද්ධි අධිකාරිය මෙහෙයවනු ලබන අතර, සමෘද්ධි කොමසාරිස් ජනරාල්වරයා සමෘද්ධි අධිකාරියෙහිද අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ක්‍රියා කරනු ඇත.

2. සියලු දිසාපතිවරුන් සමෘද්ධි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ද, සමෘද්ධි කොමසාරිස් ජනරාල් කාර්යාලයේ දිස්ත්‍රික් කොමසාරිස්වරුන්ද වේ.

3. සියලු ප්‍රදේශීය ලේකම්වරුන් සමෘද්ධි අධිකාරියේ සහකාර අධ්‍යක්ෂවරුන්ද, සමෘද්ධි කොමසාරිස් කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස්වරුන්ද වේ.

4.. ග්‍රාම සේවා නිලධාරීන්, නියෝජ්‍ය සමෘද්ධි කොමසාරිස්වරුන් ලෙස කටයුතු කරන ප්‍රාදේශීය ලේකම්වරුන් හා සමෘද්ධි බලකාය අතර සම්බන්ධීකරණ කටයුතු කරනු ඇත.

## සමෘද්ධි ව්‍යාපාරය සහ පළාත් සභා

1. සමෘද්ධි ව්‍යාපාරය ඒ ඒ පළාත් සභා බල ප්‍රදේශයතුළ ක්‍රියාත්මක කිරීමේදී එම පළාත්සභාවල ක්‍රියාත්මක සහයෝගය ලබාගැනීම සඳහා අතිගරු ජනාධිපතිතුමියගේ ප්‍රධානත්වයෙන් විෂය භාර අමාත්‍යවරයා සහ පළාත්සභා මහ ඇමතිවරු, සම්බන්ධීකරණ මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමට අදහස් කරයි.

2. පළාත් සභා මට්ටමේදී මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීමට, මධ්‍යම රජයේ විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා ප්‍රධාන ලේකම්වරු හා අනෙකුත් පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්ද සම්බන්ධීකරණ මණ්ඩලයක් ලෙස ක්‍රියා කරවීමටද බලාපොරොත්තු වේ.

## කලාප සමෘද්ධි සම්මේලනය

ඒ ඒ කලාපයට අයත් සියලු ග්‍රාමීය සමෘද්ධි බලකායන්වල විධායක සභිකයින්ගෙන් කලාපීය සමෘද්ධි සම්මේලනය සංයුක්ත වේ

## ප්‍රාදේශීය සමෘද්ධි සම්මේලනය

අදල බල ප්‍රදේශයේ සියලුම කලාපිය සමෘද්ධි සම්මේලනවලින් දසදෙනෙකු බැගින් ප්‍රාදේශිය සමෘද්ධි සම්මේලනය නියෝජනය කරනු ඇත.

## දිස්ත්‍රික් සමෘද්ධි සම්මේලනය

අදාළ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය සමෘද්ධි සම්මේලනයකින්ම දහදෙනා බැගින් දිස්ත්‍රික් සමෘද්ධි සම්මේලනය නියෝජනය කරනු ඇත.

## ජාතික සමෘද්ධි සම්මේලනය

සෑම දිස්ත්‍රික්කයකින්ම දහදෙනා බැගින් ජාතික සමෘද්ධි සම්මේලනය නියෝජනය කරනු ලැබේ. මේ අයගෙන් විසිපස් දෙනෙකු ජාතික සමෘද්ධි සම්මේලන විධායක කමිටුවට පත්වේ.

## සමෘද්ධි බැංකුව

සමෘද්ධි අධිකාරිය යටතේ සමෘද්ධි බැංකුවක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. මෙහි මූලික අරමුණ වන්නේ, සමෘද්ධි වැඩ සටහනට සම්බන්ධ ව්‍යාපෘතීන්ට අවශ්‍ය වන්නාවූ මූල්‍ය පහසුකම් සැලසීම සහ ග්‍රාමීය ඉතිරිකිරීම් දිරිගැන්වීමට ක්‍රියා කිරීමය.

## සමෘද්ධි ලොතරැයිය

දුප්පත්කම පිටුදැකීමේ ජාතික ව්‍යාපාරය වන සමෘද්ධි වැඩ සටහන වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය මගින්, සමෘද්ධි ලොතරැයියක් හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.

## සමෘද්ධි රක්ෂණය

සී/ ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සමෘද්ධි ව්‍යාපාරය වෙනුවෙන් විශේෂ රක්ෂණ සහතික ක්‍රම සමෘද්ධි නියාමකයින්ටත්, සහනාධාර ලාභීන්ටත් හඳුන්වාදීමට සැලසුම් කර ඇත.

ඇමුණුම 1

## පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දරිද්‍රතාවය පිටුදැකීමෙ වැඩ පිළිවෙළ

1. දරිද්‍රතාවයෙන් පෙලෙන ශ්‍රී ලාංකික ජනතාව ඉන් මුදවා ගැනීමෙ ජාතික වැඩ පිළිවෙළ ''සමෘද්ධි ව්‍යාපාරය'' නමින් හැඳින්වේ.

2. 'සමෘද්ධි ව්‍යාපාරයේ පළමුවන අදියර මගින් නව සහනාධාර වැඩ පිළිවෙළක් හඳුන්වා දෙන අතර, එහි දෙවන අදියර මගින් අඩු ආදයම් ලබන පවුල්වල ආදයම් වැඩි කිරීම සඳහා ආර්ථික සංවර්ධන වැඩ පිළිවෙළක් හඳුන්වා දෙනු ඇත.

### සමෘද්ධි ව්‍යාපාරය

1. සමෘද්ධි ව්‍යාපාරයතුලින් අඩු ආදයම් ලබන සෑම පවුලක් වෙනුවෙන්ම වෙන් වෙන්ව පවුල පදනම් කොටගත් ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක් ඇති කෙරේ.

2. පවුල් සංවර්ධන ව්‍යාපෘති හා ග්‍රාම සංවර්ධන වැඩ පිළිවෙළ සම්බන්ධීකරණය කිරීමෙ හා ක්‍රියාත්මක කිරීමෙ මධ්‍යස්ථානය මෙය වෙයි.

3. මෙම සෑම මධ්‍යස්ථානයකම ගමෙ උගත්, කාර්යශූර තරුණ තරුණියන්ගෙන් තෝරාගත් ව්‍යාපෘති නිලධාරියෙකු හා සංවර්ධන නිලධාරියෙකු සේවයේ යොදවනු ඇත.

4. අදල සංවර්ධන ව්‍යාපෘති සැකසීම සඳහාත්, ඒවා රාජ්‍ය හා අනෙකුත් ආයතන සමග සම්බන්ධ කිරීම සඳහාත්, මෙම ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහාත්, ඒ ඒ පවුල්

උනන්දු කිරීම සඳහාත්, අදාල නිලධාරීන්ට කෙටිකාලීන හා සූක්ෂම පුහුණුවක් ලබා දෙනු ඇත.

5. පවුල් සංවර්ධන ව්‍යාපෘතියක් නිරීක්ෂණය කිරීමේදී අවධානය යොමුවන්නේ අදල පවුල සතු, සම්පත් ශක්තීන් හා හැකියාවන් මත ඔවුන්ගෙන් පවුලේ ආදායම වැඩි කිරීම සඳහා කුමන ආර්ථික කටයුත්තකට යොමු කරනවාද යන්නයි. එය පෞද්ගලික අංශයේ සංවිධිත ආයතනයක රැකියාවක් හෝ ස්වයංරැකියාවක් ද විය හැකිය. එසේ නැත්නම් ස්වයංව්‍යාපාරයක් වීමට ද හැකිය. මීටත් අමතරව සාමූහික නිෂ්පාදන හෝ ව්‍යාපාර කටයුත්තක් වීමට ද පුළුවන. රජයේ රැකියාවක යොමු කිරීම ද මෙහි තවත් අංගයකි.

6. කෙසේ නමුත් ගමේ ඉදිවන ''ග්‍රාමීය සමෘද්ධි බලකාය'' සෑම පවුලකම දියුණුව වෙනුවෙන්, වෙන් වෙන්ව විශේෂ අවධානය යොමු කර සංවර්ධන ක්‍රියාදමය ඉදිරියට මෙහෙයවනු ඇත.

7. අදල ව්‍යාපෘතීන්ට අවශ්‍ය දැනුම, පුහුණුවීම, මූලධනය, උපදේශක සේවා යනාදිය සමෘද්ධි මධ්‍යස්ථානය විසින් අදල ආයතන හා පුද්ගලයන්ගේ සහයෝගය ඇතිව සංවිධානය කරනු ඇත.

8. මෙම සමෘද්ධි මධ්‍යස්ථානය තුල අදළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවාවන්, බැංකු, ව්‍යාප්ති සේවා මධ්‍යස්ථාන, රාජ්‍ය ආයතන සහ වෙනත් මූල්‍ය හා තාක්ෂණික ආයතන හා පෞද්ගලික ව්‍යාපාර හා ව්‍යාපාරිකයින් මගින් ජංගම සේවා ක්‍රමයට සැපයෙනු ඇත.

9. මෙම ව්‍යාපෘතීන් සාර්ථක කරගැනීම සඳහා රජයේ දයකත්වයට අමතරව ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බැංකු,

සංඝ, රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික අංශය සංවිධානාත්මක ලෙස සහභාගි කරවා ගනු ඇත. මේ සඳහා විදේශීය රට වලිනුත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලිනුත් රාජ්‍ය නොවන ජාත්‍යන්තර සේවා සහ සංවර්ධන ආයතන වලිනුත් ආධාර උපකාර ලබාගැනීමට බලාපොරොත්තුවේ.

10. මෙම පවුල් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් වලින් කොටසක් අප විසින් ආරම්භ කරන සමෘද්ධි බැංකුව මගින් ද ලබාදීමට බලාපොරොත්තුවේ. මෙම බැංකුව මෙවැනි සංවර්ධන ව්‍යාපාර වලට ආධාර කරන වෙනත් රටවල ඇති ග්‍රාමීය බැංකුවල සාර්ථක අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් ආරම්භ කෙරේ.

11. සමෘද්ධි මධ්‍යස්ථානයේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා අදාල බල ප්‍රදේශයේ පූජ්‍ය පක්ෂය ඇතුලු දැන උගත් අයගෙන් සැදුම්ලත් උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ඇත.

12. පවුල් සංවර්ධන ක්‍රියාදමයේ ප්‍රගතිය අධීක්ෂණය කරනු සඳහා, ජනතා සහභාගිත්වය ඇති ආයතන පිහිටවනු ඇත.

13. මෙම වැඩ පිළිවෙලේ සියලු කටයුතු දේශපාලනයෙන් තොරව හා නාස්තිකාර කටයුතු වලින් තොරව, හුදෙක් ඉලක්ක අරමුණු ඉටුකිරීම සඳහා කැපවීමෙන් දායක්වය දෙන වැඩ පිළිවෙලක් ලෙස ක්‍රියාත්මක වේ.

14. මෙම කටයුතු ප්‍රාදේශීය මට්ටමෙන් දිසා මට්ටමෙන් හා ජාතික මට්ටමේ සම්බන්ධීකරණ අධීක්ෂණය කරන, නිලධාරිවාදී නොවන ආයතන පද්ධතියක් යටතේ සංවිධානය කොට විශේෂ අමාත්‍යාංශයක වගකීමට යටත් කරනු ඇත.

ඇමුණුම 2

## සමෘද්ධි වැඩ සටහනෙහි සංවිධානය ව්‍යුහය

ජාතික සමෘද්ධි මෙහෙයුම් කමිටුව

|

ගරු ජනාධිපතිතුමිය - සභාපති

|

ගරු ඇමතිතුමා


|

ගරු නියෝජ්‍ය ඇමතිතුමා

- විෂයභාර අමාත්‍ය ලේකම්
- අදාල අමාත්‍යාංශයන්හි ලේකම්වරු
- ජාතික උපදේශකයින්
- දිස්ත්‍රික් ලේකම්වරු
- සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්
- සමෘද්ධි කොමසාරිස් ජනරාල්
- සභාපති සමෘද්ධි බැංකුව
- සමෘද්ධි සම්මේලනයෙහි සභාපති සහ ලේකම්
- විමර්ශන සහ ප්‍රගති සමාලෝචන ඒකකයෙහි ප්‍රධානියා

ඇමුණුම 3

# සමෘද්ධි අධිකාරිය (මුලස්ථාන සැකැස්ම)



ඇමුණුම 4

## සමෘද්ධි අධිකාරිය (ප්‍රාදේශීය ව්‍යුහය)

අධ්‍යක්ෂ ජනරාල්

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂවරුන්

(ප්‍රධාන කාර්යාලය)

දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්

දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්

සමෘද්ධි කළමනාකරුවන්

සමෘද්ධි නියාමකයින්


ඇමුණුම 5

## සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

- කොමසාරිස් ජනරාල්
  - නියෝජ්‍ය කොමසාරිස්වරුන්
    - සහකාර කොමසාරිස්වරුන්
  - දිස්ත්‍රික් කොමසාරිස්වරුන් (දිස්ත්‍රික් ලේකම්වරුන්)
    - නියෝජ්‍ය කොමසාරිස්වරුන් (ප්‍රාදේශීය ලේකම්වරුන්)
      - සම්බන්ධීකරණ නිලධාරීන් (ග්‍රාම නිලධාරීන්)


ඇමුණුම 6

## සමෘද්ධි බැංකුව



ඇමුණුම 7

## සමෘද්ධි සම්මේලනය



## සමෘද්ධි තේමා ගීතය

යෞවන යෞවනියෝ අපි
සූරවිරු ලක් වැසියෝ අපි
සමෘද්ධි - සමෘද්ධි - සමෘද්ධි- සමෘද්ධි
සමෘද්ධි නියාමකයෝ අපි

අගහිඟකම් මැද වෙසෙනා
පොදුජන පිරිපත හඳුනා......
පිළියම් යොදමින් දෙපයින් නැගිටින, දැයකට
පියවර තබනා
සංවර්ධනයේ නව මාවතකට දෙස බස රැස
යොමු කරනා
සමෘද්ධි නියාමකයෝ අපි.......

දූ කුල මල ගොත් නොතකා
එක පවුලක් සේ සලකා
දෙගුරුන් ඇසුරෙන් ඔවදන් ලබමින් ඒ මග
පියමං කරනා
නැණයෙන් ගුණයෙන් පිරිපුන් මිනිසුන් තිවහන ලොව
ගොඩ නගනා
සමෘද්ධි නියාමකයෝ අපි

යුතුකම් මැනවින් හඳුනා
ඇපකැපවී ඉටුකරනා.....
ගොවිකම් අත්කම් නවකම් නංවා ඉපැදුණු බිම
සරු කරනා
හෙට නොව අද ලොව පිළිගෙන සුරකින වරමින් බුහුමන් ලබනා
සමෘද්ධි නියාමකයෝ අපි

# සමෘද්ධි

සමෘද්ධි ව්‍යාපාරය යටතේ ක්‍රියාත්මක වන ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේදී මෙහි බෙදා වෙන්කර, විස්තර කර ඇති අංශවලට වඩා, නවීන වූත්, සංකීර්ණ වූත්, ප්‍රශ්න ගැටළු හා අභියෝග මතුවන බව අපි දනිමු. එහෙත් ඒ සියල්ලට මුහුණ දෙමින්, විශ්ලේෂණය කර ගනිමින්, පිළිතුරු සොයාගත හැකි ශක්තිමත් යන්ත්‍රනයක් සමෘද්ධි ව්‍යාපාරය විසින් ගොඩනගනු ඇත. මෙහිදී අප විසින් ඉදිරිපත් කර ඇති දර්ශනය හා වැඩපිළිවෙල අඩු වරප්‍රසාද ලත් පංතියේ හා රටේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවන්හි දී වෙනස් කිරීමට අප සූදානමින් සිටිමු. ඒ අනුව, අවශ්‍ය යැයි හැඟෙන විටදී නම්‍යශීලී වනවා මෙන්ම දැඩි අනම්‍යතාවයෙන් යුතුව කටයුතු කළයුතු අවස්ථාවලදී එසේ කිරීමට ද පසුබට නොවනවා ඇත. සමෘද්ධි අධිකාරිය, සමෘද්ධි කොමසාරිස් ජනරාල් කාර්යාලය, සමෘද්ධි සම්මේලනය, සමෘද්ධි බැංකුව හා සමෘද්ධි විමර්ෂණ ඒකකය එම යන්ත්‍රනයේ ප්‍රධාන දැතිරෝද ලෙස ක්‍රියාත්මක වනු ඇත.